# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1706/18 - 2011 මැයි 20 වැනි සිකුරාදා - 2011.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

4(2) වැනි වගන්තිය යටතේ නියෝගය

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් කන්දේ මොහොට්ටාලලාගේ සුනිල් කන්දෙගෙදර වන මම, මෙම නියෝගය මගින් (2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 4 වගන්තියේ (2) උප වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන යටතේ) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි උපලේඛනයේ දක්වා ඇති කිසියම් ප්‍රතිලාභයක වටිනාකම වශයෙන් යොදා ගත යුතු අගය එකී [2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත] දේශීය ආදායම් පනත යටතේ සලස්වා ඇති යම් නිදහස් කිරීමකට යටත්ව, එම වගන්තියේ කාර්යය සඳහා එකී යම් ප්‍රතිලාභයක් වෙනුවෙන් දැනටමත් තීරණය කර ඇති කිසියම් අගයක් නොතකා, මෙයින් නිශ්චය කරමි.

කන්දේ මොහොට්ටාලලාගේ සුනිල් කන්දෙගෙදර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2011 මැයි 13 වැනි දින,
කොළඹ,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

(1) *සේවායෝජකයා විසින් ප්‍රදානය කරනු ලබන සමාගම් කොටස්වල වටිනාකම*

යම් සේවායෝජකයකුගේ සේවානියුක්තිකයකුට හෝ එකී සේවානියුක්තිකයා විසින් නම් කරන්නෙකුට, එකී සේවායෝජකයා විසින් හෝ සේවායෝජකයා වෙනුවෙන් යම් කොටසක් විභජනය කිරීමක් හෝ යම් කොටසක් අත්පත් කර ගැනීම සඳහා මනාපය ලබාදීමට අවස්ථාවක් දීම මගින් එම සේවානියුක්තිකයාට උපචිත වන යම් ප්‍රතිලාභයක "වටිනාකම" යනුවෙන් අදහස් කරනුයේ, අදාළ කොටස් විභජනයේ දී හෝ කොටස් අත්පත්කර ගැනීමට මනාපය ලබාදීමට අවස්ථාවක් දීමේදී, සේවායෝජක විසින් අය කරන ලද මිල, අවස්ථාවෝචිත පරිදි, එම කොටස් (ඍජුවම හෝ මනාපය ක්‍රියාත්මක කිරීමෙන්) විභජනය කරන අවස්ථාවේ දී එම කොටස්වල වෙළඳපල වටිනාකම හෝ මනාපය ලබාදීමට ලබාදෙන අවස්ථාව අලෙවි කිරීමෙන් ලබන මුදල ඉක්මවන යම් අතිරික්තයකි.

1A - G 14542— 1860 (2011/05)

(2) *සේවායෝජකයා විසින් සපයනු ලබන යම් වාසස්ථානයකින් ලැබෙන ප්‍රතිලාභවල වටිනාකම-*

(අ) 4(1)(ඈ) වගන්තියේ කාර්යය සඳහා සේවායෝජකයා විසින් සපයා දෙන ලද යම් වාසස්ථානයක අදාළ අවස්ථාවන්හි දී "කුලී වටිනාකම" (එකී වගන්තියෙහි තක්සේරු කිරීම සඳහා වූ පදනම නිශ්චිතව දක්වා නොමැති විට) පහත සඳහන් පරිදි නිර්ණය කළ යුතුය ඃ-

(i) වරිපනම් බදු පනවා නොමැති ප්‍රදේශයක පිහිටා ඇති වාසස්ථානයක් සඳහා වන විට, දළ පාරිශ්‍රමිකයෙන් 10%ක් හෝ මසකට රු. 3,000ක් යන දෙකෙන් අඩු අගය.

(ii) වතු බංගලා සම්බන්ධයෙන් වන විට, දළ පාරිශ්‍රමිකයෙන් 7.5%ක් හෝ මසකට රු. 2,000ක් යන දෙකින් අඩු අගය.

(ආ) වාසස්ථානය සඳහා ගෘහ භාණ්ඩ ද සපයා ඇත්නම්, දළ පරිශ්‍රමිකයෙන් 2.5%ක් හෝ මසකට රු. 1,500ක් යන දෙකෙන් අඩු අගය ඉහතින් නිර්ණය කරන ලද අගයට එකතු කළ යුතු ය.

(ඇ) සේවානියුක්තිකයා පදිංචිව සිටින නිවසක් සම්බන්ධ යම් වියදමක් සේවායෝජකයා විසින් ප්‍රතිපූර්ණය කරනු ලබන්නේ නම්, එම ප්‍රතිලාභයෙහි අගය සේවායෝජකයා විසින් ප්‍රතිපූර්ණය කරන ලද සත්‍ය වියදම විය යුතු ය.

(3) *සේවායෝජකයා විසින් සපයනු ලබන ප්‍රවාහන පහසුකම්*

(අ) සේවායෝජකයා විසින් සපයනු ලබන එන්ජින් ධාරිතාවය 1500 cc හෝ ඊට වැඩි යම් මෝටර් වාහනයක් (සම්පූර්ණයෙන් ම හෝ යම් ප්‍රමාණයකට) පෞද්ගලිකව පරිහරණය කිරීමෙන් ලබන ප්‍රතිලාභයේ අගය-

(i) රියදුරු සහ ඉන්ධන වියදම් දරමින් සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, එය මසකට රුපියල් පනස් දහසක් ලෙස සැළකිය යුතු ය.

(ii) රියදුරු නොමැතිව ඉන්ධන වියදම් දරමින් සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, එය මසකට රුපියල් තිස්පන් දහසක් ලෙස සැළකිය යුතු ය.

(iii) ඉන්ධන නොමැතිව නමුත් රියදුරු සමග එකී පහසුකම සේවායෝජකයා විසින් සපයා දෙන්නේ නම්, එය මසකට රුපියල් තිස් දහසක් ලෙස සැළකිය යුතු ය.

(iv) ඉන්ධන සහ රියදුරු නොමැතිව සේවායෝජකයා විසින් එකී පහසුකම සපයන්නේ නම්, මසකට රුපියල් පහළොස් දහසක් ලෙස සැළකිය යුතුය.

(ආ) සේවායෝජකයා විසින් සපයනු ලබන එන්ජින් ධාරිතාව 1500 cc අඩු යම් මෝටර් වාහනයක් (සම්පූර්ණයෙන්ම හෝ යම් ප්‍රමාණයකට) පෞද්ගලිකව පරිහරණය කිරීමෙන් ලබන ප්‍රතිලාභයේ අගය -

(i) රියදුරු සහ ඉන්ධන වියදම් දරමින් සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, මසකට රුපියල් තිස්පන් දහසක් ලෙස සැළකිය යුතු ය.

(ii) රියදුරු නොමැතිව ඉන්ධන වියදම් දරමින් සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, මසකට රුපියල් විසිපන් දහසක් ලෙස සැළකිය යුතු ය.

(iii) ඉන්ධන නොමැතිව රියදුරු සමග සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, මසකට රුපියල් විසි දහසක් ලෙස සැළකිය යුතු ය.

(iv) ඉන්ධන සහ රියදුරු නොමැතිව සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, මසකට රුපියල් දස දහසක් ලෙස සැළකිය යුතු ය.

(ඇ) යම් මෝටර් බයිසිකලයක් සේවානියුක්තිකයා විසින් (සම්පූර්ණයෙන් ම හෝ යම් ප්‍රමාණයකට) පෞද්ගලිකව පරිහරණය කිරීමෙන් ලබන ප්‍රතිලාභයේ අගය–

(i) ඉන්ධන වියදම් දරමින් සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, (එහි එන්ජින් ධාරිතාවය නොසලකමින්) මසකට රුපියල් පන්දහසක් විය යුතු ය.

(ii) ඉන්ධන නොමැතිව සේවායෝජකයා විසින් එකී පහසුකම සපයා දෙන්නේ නම්, (එහි එන්ජින් ධාරිතාවය නොසලකමින්) මසකට රුපියල් තුන් දහසක් විය යුතු ය.

(ඈ) සේවායෝජක විසින් නිවැරදි සටහන් පවත්වා ගනිමින් (සම්පූර්ණයෙන් හෝ යම් ප්‍රමාණයකට) පෞද්ගලිකව පරිහරණයට සේවානියුක්තිකයෙකුට-

(i) යම් මෝටර් වාහනයක් ලබාදීමේ දී, එම පහසුකම ලැබීමේ ප්‍රතිලාභයේ අගය (වාහනයේ එන්ජින් ධාරිතාවය නොසලකමින්) කිලෝ මීටරයකට රුපියල් පහළොවක් සේ සැළකිය යුතු ය.

(ii) යම් මෝටර් බයිසිකලයක් ලබාදීමේ දී, එම පහසුකම ලැබීමේ ප්‍රතිලාභයේ අගය කිලෝ මීටරයකට රුපියල් තුනක් සේ සැළකිය යුතු ය.

(ඉ) සේවානියුක්තිකයාට අයත් යම් මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් සම්බන්ධයෙන් ඉන්ධන සහ නඩත්තු කිරීම වෙනුවෙන් සේවානියුක්තිකයා විසින් දරන ලද යම් වියදමක් සේවායෝජකයා විසින් ප්‍රතිපූරණය කරන විටක දී අදාළ ප්‍රතිලාභයේ අගය, සේවායෝජකයා විසින් දරන ලද හෝ ප්‍රතිපූරණය කරන ලද සත්‍ය වියදම් විය යුතු ය.

(4) *සේවායෝජකයා විසින් සපයනු ලබන අනෙකුත් ප්‍රතිලාභ*

| *ප්‍රතිලාභයේ ස්වභාවය* | *ප්‍රතිලාභවල වටිනාකම* |
|---|---|
| 1. විදේශිකයන් සඳහා හෝටල් පහසුකම් සැපයීම | ශ්‍රී ලංකාවට පැමිණි දින සිට මාස 3ක කාලයක් සඳහා වියදමෙන් 25%ක් සහ ඉන්පසු වියදමින් 100%ක්. |
| 2. මෙහෙකරුවන් යනාදිය සැපයීම | පිරිවැයෙන් 100%ක් |
| 3. විදුලිය සහ ගෑස් යනාදිය සැපයීම | පිරිවැයෙන් 100%ක් |
| 4. වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම : | |
| (i) සේවානියුක්තිකයන් වෙනුවෙන් වන වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් මත, රක්ෂණ වාරික සමස්ථයක් ලෙස සේවායෝජකයා විසින් දරන විට, | සේවානියුක්තිකයාට ප්‍රතිපූරණය කරනු ලබන වෛද්‍ය බිල්පත්වල මුළු මුදල (බදු බැදියාව ඇතිවනුයේ ප්‍රතිපූරණය කරන අවස්ථාවේ දී ය.) |
| (ii) වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් මත එක් එක් සේවානියුක්තිකයා සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් සේවායෝජකයා විසින් දායක මුදල් ගෙවන විට, | එම දායකත්ව මුදලෙන් 100%ක්. |
| (iii) සේවායෝජකයා විසින් බිල්පත් ගෙවනු ලබන විට හෝ ප්‍රතිපූරණය කරනු ලබන විට | එම වෛද්‍ය බිල්පත්වලින් 100%ක්. |
| 5. නොමිලේ ලබා දෙන ආහාර | පිරිවැයෙන් 100%ක්. |
| 6. ජීවිත රක්ෂණ වාරිකය ගෙවීම | පිරිවැයෙන් 100%ක්. |
| 7. දුරකථන බිල්පත් සහ වාර්ෂික ගාස්තු ගෙවීම (පෞද්ගලික කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන දුරකථන සම්න්ධයෙන්) | පිරිවැයෙන් 50%ක්. |
| 8. ගුවන් ටිකට්පත් (ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ මිහින් ලංකා ගුවන් සමාගමේ සේවානියුක්තිකයන් වෙත ලබා දෙන ටිකට් පත් හැර) | පිරිවැයෙන් 100%ක්. |
| 9. බදු ගෙවීම | ගෙවන ලද බදු මුදල් ප්‍රමාණය (අංක 06 දරන බදු චක්‍රය බලන්න.) |

06-104

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.